විචලතා විශ්ලේෂණය

AAT අදියර III

MAF - කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය

අමිල සම්පත් මුදලිගේ
ACA,MAAT(Prize winner), Bsc. Finance (Special) USJ

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

විචලතා විශ්ලේශණය - Variance Analysis

AAT III

Management Accounting & Finance

Amila Sampath Mudalige

MAAT & AAT Prize Winner,

CA Sri Lanka Finalist.

JMC vLearning "your virtual learning partner"

විචලතා විශ්ලේශනය - Variance Analysis

ප්‍රමිත පිරිවැයකරනය යනු , යම් නිශ්චිත කාර්යක් සදහා කළින් හදුනා ගනු ලබන පිරිවැය යි.

සැලසුම්ගත, අය වැය ගත හෝ ප්‍රමිත පිරිවැයක් සහ දරන ලද සත්‍ය පිරිවැය අතර වෙනස විචලතාවයක් වේ. ඒ හා සමාන සංසන්දනයක් ආදායමට ද කළ හැකිය. ප්‍රමිත හා සත්‍ය ප්‍රථිඵල අතර මුළු වෙනස විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය විචලතා විශ්ලේෂණය ලෙස හැඳින්වේ.

සත්‍ය ප්‍රථිඵලය, අපේක්ෂිත ප්‍රථිඵලවලට වඩා යහපත්නම් එය වාසිදායක Favourable (F) **විචලතාවයක් ලෙස ද සත්‍ය, ප්‍රථිඵල අපේක්ෂිත ප්‍රථිඵලවලට වඩා අයහපත්නම් අවාසිදායක** (Adverse (A)) **විචලතාවයක් ලෙසද හැඳින්වේ.**

විචලතාවයන් ප්‍රධාන වශයෙන් කාණ්ඩ තුනකට වෙන්කළ හැකිය.

- **විචල්‍ය පිරිවැය විචලතාවයන්**
- **විකුණුම් විචලතාවයන්**
- **ස්ථාවර නිශ්පාදන පොදුකාර්ය විචලතාවයන්**

JMC vLearning
"your virtual learning partner"

සෘජු ද්‍රව්‍ය පිරිවැය විචලතාවයන්

✓ **සෘජු ද්‍රව්‍ය මුළු විචලතාවය**

නිමැවුම සඳහා යොදා ගත් ද්‍රව්‍ය වෙනුවෙන් සත්‍ය වශයෙන්ම කොපමණ පිරිවැයක් දැරුවේද සහ ඒවා කොපමණ පිරිවැයක් විය යුතුව තිබුණේද යන්න අතර වෙනස සෘජු ද්‍රව්‍ය මුළු විචලතාවයයි.

සෘජු ද්‍රව්‍ය මුළු විචලතාවය =

හෝ

සෘජු ද්‍රව්‍ය මුළු විචලතාවය =

✓ **සෘජු ද්‍රව්‍ය මිල විචලතාවය**

භාවිතා කරන ලද හෝ මිලදී ගන්නා ලද සත්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය සඳහා දරන ලද සත්‍ය පිරිවැයත් දැරිය යුතුව තිබූ ප්‍රමිත පිරිවැයත් අතර වෙනස සෘජු ද්‍රව්‍ය මිල විචලතාවය ලෙස හැඳින්වේ. එනම් ද්‍රව්‍ය සඳහා කොපමණ පිරිවැයක් සත්‍ය ලෙස දරන්නට සිදු වූයේද සහ කොපමණ පිරිවැයක් දැරිය යුතුව තිබුනේද යන්නත් අතර වෙනසයි.

සෘජු ද්‍රව්‍ය මිල විචලතාවය =

✓ **සෘජු ද්‍රව්‍ය භාවිත විචලතාවය**

ද්‍රව්‍ය ඒකකයක ප්‍රමිත පිරිවැය මත අගය කරන ලද, සත්‍ය වශයෙන්ම නිෂ්පාදනය කළ ඒකක ප්‍රමාණය සඳහා භාවිතා කළ යුතු ව තිබූ ප්‍රමිත ද්‍රව්‍ය ප්‍රමාණය සහ සත්‍යවශයෙන්ම භාවිතයට ගත් ද්‍රව්‍ය ප්‍රමාණය අතර වෙනස සෘජු ද්‍රව්‍ය භාවිත විචලතාවය ලෙස හැඳින්වේ. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කරනවානම් , ප්‍රමිත පිරිවැය මත අගය කරන ලද භාවිතා කළ යුතුව තිබූ ද්‍රව්‍ය කොපමණ ද සහ කොතරම් ද්‍රව්‍ය භාවිතා කළාදැයි අතර වෙනසයි.

සෘජු ද්‍රව්‍ය භාවිත විචලතාවය =

JMC vLearning
"your virtual learning partner"

6.2 උදාහරණය : සෘජු ද්‍රව්‍ය විචලතාවය

X 'නිෂ්පාදිතය සඳහා ප්‍රමිත සෘජු ද්‍රව්‍ය පිරිවැය පහත දක්වා ඇත.
කිලෝ ග්‍රෑමයකට රු. 10 බැගින් **y** ද්‍රව්‍යයෙන් කිලෝ ග්‍රෑම් 10 ක් X ඒකකයක් සඳහා රු.100 යි.

හතරවන කාලච්ඡේදයේ දී X නිෂ්පාදිතයෙන් ඒකක 1000 ක් නිෂ්පාදනය කෙරිණි. ඒ සඳහා **y** ද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 11,700 ක් රු. 98,600 ක පිරිවැයක් යටතේ භාවිතා විය.

ඉහත සඳහන් තොරතුරු භාවිතා කරමින් පහත සඳහන් විචලතාවයන් **ගණනය කරන්න.**

අවශ්‍ය වන්නේ :

(a) සෘජු ද්‍රව්‍ය මුළු විචලතාවය
(b) සෘජු ද්‍රව්‍ය මිල විචලතාවය
(c) සෘජු ද්‍රව්‍ය භාවිත විචලතාවය

✓ **සෘජු ද්‍රව්‍ය මිශ්‍රන විචලතාවය**

✓ **සෘජු ද්‍රව්‍ය ඵලදා විචලතාවය**

JMC vLearning
"your virtual learning partner"

G **නිශ්පාදන ඒකකයකටඅදාල ප්‍රමිත පිරිවැය තොරතුරු පහත පරිදි වේ.**

ද්‍රව්‍ය A , 2 Kg @ Rs.40/- = Rs.80/-

ද්‍රව්‍ය B , 3 Kg @ Rs.20/- = Rs.60/-

සත්‍ය තොරතුරු පහත පරිදි වේ.

ද්‍රව්‍ය A , 15,000 Kg @ Rs.40/- = Rs.615,000/-

ද්‍රව්‍ය B , 9,000 Kg @ Rs.18/- = Rs.162,000/-

සත්‍ය නිශ්පාදන ඒකක ප්‍රමානය 5000කි.

අවශ්‍ය වන්නේ,

- ✓ **සෘජු ද්‍රව්‍ය මිල විචලතාවය**
- ✓ **සෘජු ද්‍රව්‍ය මිශ්‍රන විචලතාවය**
- ✓ **සෘජු ද්‍රව්‍ය ඵලදා විචලතාවය**
- ✓ **සෘජු ද්‍රව්‍ය භාවිත විචලතාවය**
- ✓ **සෘජු ද්‍රව්‍ය මුළු විචලතාවය**

සෘජු ශ්‍රම පිරිවැය විචලතාවයන්

- ✓ **සෘජු ශ්‍රම මුළු විචලතාවය**

සෘජු ශ්‍රම මුළු විචලතාවය යනු යම් නිමැවීමක ශ්‍රමය සඳහා දැරිය යුතුව තිබු පිරිවැය සහ දරන ලද පිරිවැය අතර වෙනසයි.

සෘජු ශ්‍රම මුළු විචලතාවය =

හෝ

සෘජු ශ්‍රම මුළු විචලතාවය =

✓ **සෘජු ශ්‍රම අනුපාත විචලතාවය**

සෘජු ශ්‍රම අනුපාත විචලතාවය යනු ගෙවීම් සඳහා සලකා බැලූ සත්‍ය පැය ගණන සඳහා දරන ප්‍රමිත පිරිවැය සහ සත්‍ය පිරිවැය අතර වෙනසයි. මෙය බොහෝ දුරට සෘජු ද්‍රව්‍ය මිල විචලතාවයට සමාන වේ. ශ්‍රමය සඳහා කොපමණ පිරිවැයක් දැරුවේද හා දැරිය යුතුව තිබුණේ ද යන්න අතර වෙනස ලෙසද මෙය හැඳින්විය හැකිය.

සෘජු ශ්‍රම අනුපාත විචලතාවය =

✓ **සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලතාවය**

සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලතාවය සෘජු ද්‍රව්‍ය භාවිතා විචලතාවයට සමාන වේ. එය සත්‍ය වශයෙන්ම නිෂ්පාදනය කරන ලද ඒකක ප්‍රමාණය සඳහා පැයකට ප්‍රමිත අනුපාතය යටතේ අගය කරන ලද වැඩ කළ යුතුව තිබූ පැය ගණන සහ සත්‍ය වශයෙන්ම වැඩ කළ පැය ගණන අතර වෙනසය.

සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලතාවය =

Example :

X නිෂ්පාදිතයේ ප්‍රමිත සෘජු ශ්‍රම පිරිවැය පහත දැක්වේ. පැයකට රුපියල් 500 බැගින් Z ශ්‍රේණියේ ශ්‍රමය පැය 2 ක් = X නිෂ්පාදිත ඒකකයට රු. 1000 යි.

හතරවන කාලච්ඡේදය තුළදී X නිෂ්පාදිතයෙන් ඒකක 1,000 නිෂ්පාදනය කෙරිණි. එහිදී Z ශ්‍රේණියේ සෘජු ශ්‍රම පිරිවැය රු. 890,000 ක් දැරීමට සිදු වූයේ වැඩ පැය 2,300 ක් සඳහා ය.

ඉහත සඳහන් තොරතුරු භාවිතා කරමින් පහත සඳහන් විචලතාවයන් **ගණනය කරන්න.**

අවශ්‍ය වන්නේ :

(a) සෘජු ශ්‍රම මුළු විචලතාවය

(b) සෘජු ශ්‍රම අනුපාත විචලතාවය

(c) සෘජු ශ්‍රම කාර්යක්ෂමතා (ඵලදායිතා) විචලතාවය

JMC vLearning "your virtual learning partner"

- ✓ **සෘජු ශ්‍රම මිශ්‍රන විචලතාවය**

- ✓ **සෘජු ශ්‍රම ඵලදා විචලතාවය**

G **නිශ්පාදන ඒකකයකටඅදාල ප්‍රමිත පිරිවැය තොරතුරු පහත පරිදි වේ.**

පුහුනු ශ්‍රමය , 1 h @ Rs.100/- = Rs.100/-

නුපුහුනු ශ්‍රමය , 2 h @ Rs.70/- = Rs.140/-

සත්‍ය තොරතුරු පහත පරිදි වේ.

පුහුනු ශ්‍රමය , 7,000 h @ Rs.90/- = Rs.630,000/-

නුපුහුනු ශ්‍රමය , 6,000 h @ Rs.75/- = Rs.450,000/-

සත්‍ය නිශ්පාදන ඒකක ප්‍රමානය 5000කි.

අවශ්‍ය වන්නේ,

- ✓ **සෘජු ශ්‍රම අනුපාත විචලතාවය**
- ✓ **සෘජු ශ්‍රම මිශ්‍රන විචලතාවය**
- ✓ **සෘජු ශ්‍රම ඵලදා විචලතාවය**
- ✓ **සෘජු ශ්‍රම කාර්යක්‍ෂමතා විචලතාවය**
- ✓ **සෘජු ශ්‍රම මුළු විචලතාවය**

විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය විචලතාවය

✓ **විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය මුළු විචලතාවය**

✓ **විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය වියදම් විචලතාවය**

✓ **විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය කාර්යක්ෂමතා විචලතාවය**

Example :

x නිෂ්පාදිතයේ විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය පහත දක්වා ඇත.

රු. 150 බැගින් පැය 2 ක් = ඒකකයකට රු. 300 යි

6 වන කාලච්ඡේදය තුළදී x නිෂ්පාදිතයෙන් ඒකක 1000 ක් නිෂ්පාදනය කළේ යැයි සිතන්න. එහිදී ශ්‍රම බලකාය පැය 2,020 ක් වැඩ කර ඇති අතර පැය 60 ක් අක්‍රීය කාලය ලෙස සැලකේ. තවද විචල්‍ය පොදු කාර්ය පිරිවැය රු. 307,500 ක් විය.

පහත සඳහන් දෑ **ගණනය කරන්න.**

(a) විචල්‍ය නිෂ්පාදන පොදු කාර්ය මුළු විචලතාවය

(b) විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය වියදම් විචලතාවය

(c) විචල්‍ය නිෂ්පාදන පොදු කාර්යක්ෂමතා විචලතාවය

JMC vLearning "your virtual learning partner"

ස්ථාවර නිශ්පාදන පොදුකාය විචලතාව

- ✓ ස්ථාවර නිශ්පාදන පොදුකාය මුළු විචලතාව

- ✓ ස්ථාවර නිශ්පාදන පොදුකාය වියදම් විචලතාව

- ✓ ස්ථාවර නිශ්පාදන පොදුකාය පරිමා විචලතාව

Example :

අයවැයගත හා සත්‍ය තොරතුරු පහත පරිදි වේ.

<u>අයවැයගත තොරතුරු</u>

අයවැයගත පොදුකාය - රු 120 000

අයවැයගත පැය ගණන් - 100 000 පැය

අයවැයගත නිශ්පාදන - 20 000 ඒකක

<u>සත්‍ය තොරතුරු</u>

සත්‍ය පොදුකාය - රු 115 500

සත්‍ය පැය ගණන් - 104 000 පැය

සත්‍ය නිශ්පාදන - 21 000 ඒකක

අවශ්‍ය වන්නේ,

ස්ථාවර නිශ්පාදන පොදුකාය මුළු විචලතාව

ස්ථාවර නිශ්පාදන පොදුකාය වියදම් විචලතාව

ස්ථාවර නිශ්පාදන පොදුකාය පරිමා විචලතාව

JMC vLearning "your virtual learning partner"

විකුණුම් විචලතාවයන්

ප්‍රමිත විකුණුම් මිලට වඩා වෙනස් විකුණුම් මිලක් නිසා අපේක්ෂිත ලාභය මත ඇතිවන බලපෑම මණිනු ලබන මිණුමක් ලෙස විකුණු ම් මිල විචලතාවය හැඳින්විය හැකිය. සත්‍ය වශයෙන් විකුණු ප්‍රමාණය සඳහා කුමන විකුණුම් ආදායමක් ලැබිය යුතුව තිබුණේද සහ සත්‍ය වශයෙන්ම ලැබුණු ආදායම අතර වෙනස මෙහිදී ගණනය කෙරේ.

- ✓ විකුණුම් ආන්තික මුළු විචලතාව

- ✓ විකුණුම් ආන්තික විචලතාව

- ✓ විකුණුම් ආන්තික පරිමා විචලතාව

JMC vLearning
"your virtual learning partner"

Example 01:

(A) **සිමාසහිත SP සමාගම, B** නමැති නිෂ්පාදිතයක් නිෂ්පාදනය කරනු ලබන අතර, ප්‍රමිත පිරිවැයකරණ ක්‍රමය භාවිත කරයි. පහත සඳහන් තොරතුරු 2019 දෙසැම්බර් මාසයට අදාල වේ.

(1) **B** නිෂ්පාදිතයට අදාල ප්‍රමිත පිරිවැය පත්‍රය පහත පරිදි වේ:

		ඒකකයකට (රු.)
සෘජු ද්‍රව්‍ය	කිලෝග්‍රෑම් එකක් රු.225/- බැගින් කිලෝග්‍රෑම් 2 ක්	450
සෘජු ශ්‍රමය	පැයකට රු.100/- බැගින් පැය 2 ක්	200
විචල්‍ය පිරිවැය	පැයකට රු.75/- බැගින් පැය 4 ක්	300
ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය	යන්ත්‍ර පැයකට රු.150/- බැගින් පැය 4 ක්	600
මුළු ප්‍රමිත පිරිවැය		1,550
විකුණුම් මිල		2,100

(2) මාසය සඳහා අයවැයගත නිෂ්පාදනය සහ විකුණුම් ඒකක 1,000 ක් වූ අතර, අයවැයගත ස්ථාවර පොදුකාර්ය මාසය සඳහා රු.575,000/- ක් විය.

(3) 2019 දෙසැම්බර් මාසය තුළ සමාගම විසින් ඒකක 950 ක නිමි නිෂ්පාදිත නිෂ්පාදනය කරන ලද අතර, මාසයට අදාල සත්‍ය පිරිවැය පහත පරිදි වේ:

		රු.
මිලදීගත් සහ පරිභෝජනය කළ අමුද්‍රව්‍ය	ඒකකයකට රු.220/- බැගින් ඒකක 2,100	462,000
ගෙවූ සෘජු ශ්‍රම පැය	පැයකට රු.105/- බැගින් පැය 2,375	249,375
විචල්‍ය පොදුකාර්ය		356,250
ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය		522,500

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් විචලනයන් **ගණනය කරන්න**:

(a) සෘජු ද්‍රව්‍ය මිල විචලනය (Direct Material Price Variance).

(b) සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය (Direct Material Usage Variance).

(c) සෘජු ද්‍රව්‍ය පිරිවැය විචලනය (Direct Material Cost Variance).

(d) සෘජු ශ්‍රම අනුපාත විචලනය (Direct Labour Rate Variance).

(e) සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලනය (Direct Labour Efficiency Variance).

(f) සෘජු ශ්‍රම පිරිවැය විචලනය (Direct Labour Cost Variance).

(g) විචල්‍ය පොදුකාර්ය පිරිවැය විචලනය (Variable Overhead Cost Variance).

(h) ස්ථාවර පොදුකාර්ය වියදම් විචලනය (Fixed Overheads Expenditure Variance).

Example 02 :

(b) **සිමාසහිත මකෝ කාපට් (පෞද්ගලික) සමාගම** විසින් මෝටර් රථ සඳහා කාපට් නිෂ්පාදනය කරනු ලබන අතර, ප්‍රමිත පිරිවැයකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලබයි.

පහත සඳහන් තොරතුරු 2018 දෙසැම්බර් මාසයට අදාල වේ:

(1) ප්‍රමිත පිරිවැය පත්‍රය පහත සඳහන් පරිදි වේ:

		කාපට් ඒකක පිරිවැය (රු.)
සෘජු ද්‍රව්‍ය	කිලෝග්‍රෑම් 1 ක් රු.400/- බැගින් කිලෝග්‍රෑම් 2 ක්	800
සෘජු ශ්‍රමය	පැයකට රු.300/- බැගින් පැය 1.5 ක්	450
විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය	පැයකට රු.100/- බැගින් පැය 1.5 ක්	150
ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය	සෘජු ශ්‍රම පැයකට රු.200/- බැගින්	300
එකතුව		**1,700**

(2) 2018 දෙසැම්බර් මාසය සඳහා වන අයවැයගත නිෂ්පාදනය ඒකක 3,500 ක් වන අතර, මාසය සඳහා අයවැයගත ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය රු.1,200,000/- කි.

(3) 2018 දෙසැම්බර් මාසය සඳහා සත්‍ය තොරතුරු පහත පරිදි විය:

		රු.
නිෂ්පාදනය සඳහා උපයෝගී කරගත් සෘජු ද්‍රව්‍ය	කිලෝග්‍රෑම් 1 ක් රු.380/- බැගින් කිලෝග්‍රෑම් 6,500 ක්	2,470,000
ගෙවූ සෘජු ශ්‍රම පැය	පැයකට රු.310/- බැගින් පැය 4,750 ක්	1,472,500
විචල්‍ය පොදුකාර්ය		850,000
ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය		1,000,000

(4) මාසය සඳහා සත්‍ය නිෂ්පාදනය, ඒකක 3,000 කි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් විචලනයන් **ගණනය කරන්න**:

(i) සෘජු ද්‍රව්‍ය මිල විචලනය (Direct Material Price Variance).

(ii) සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය (Direct Material Usage Variance).

(iii) සෘජු ද්‍රව්‍ය පිරිවැය විචලනය (Direct Material Cost Variance).

(iv) සෘජු ශ්‍රම අනුපාත විචලනය (Direct Labour Rate Variance).

(v) සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලනය (Direct Labour Efficiency Variance).

(vi) ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය වියදම් විචලනය (Fixed Production Overheads Expenditure Variance).

JMC Learning
"your virtual learning partner"

Example 03:

(A) **සීමාසහිත X සමාගම,** අපනයන වෙළෙඳපොළ සඳහා **Y නිෂ්පාදිතය** නිෂ්පාදනය කරනු ලබයි. පහත සඳහන් ප්‍රමිත පිරිවැය පත්‍රිකාව සහ ප්‍රමිත විකුණුම් මිල සමාගමේ වාර්තාවලින් උපුටාගෙන ඇත:

	ඒකකයකට (රු.)
සෘජු ද්‍රව්‍ය:	
ද්‍රව්‍ය X1 (කිලෝග්‍රෑම් 1 ක් රු.150/- බැගින්, කිලෝග්‍රෑම් 1.5 ක්)	225
ද්‍රව්‍ය X2 (කිලෝග්‍රෑම් 1 ක් රු.350/- බැගින්, කිලෝග්‍රෑම් 4 ක්)	1,400
සෘජු ශ්‍රමය (පැයකට රු.250/- බැගින්, පැය 3)	750
විචල්‍ය පොදුකාර්ය (පැයකට රු.120/- බැගින්, පැය 3)	360
මුළු විචල්‍ය පිරිවැය	2,735
විකුණුම් මිල	3,000
දායකය	**265**

2018 මැයි මාසය සඳහා අයවැයගත විකුණුම් / නිෂ්පාදන ඒකක ගණන, ඒකක 11,000 කි.

2018 මැයි මාසය සඳහා සත්‍ය ප්‍රතිඵල පහත සඳහන් පරිදි විය:

සත්‍ය විකුණුම් / නිෂ්පාදනය	(ඒකක)	11,300
විකුණුම්	(රු.)	34,804,000
සෘජු ද්‍රව්‍ය:		
ද්‍රව්‍ය X1 (කිලෝග්‍රෑම් 1 ක් රු.145/- බැගින්, කිලෝග්‍රෑම් 18,600 ක්)	(රු.)	2,697,000
ද්‍රව්‍ය X2 (කිලෝග්‍රෑම් 1 ක් රු.375/- බැගින්, කිලෝග්‍රෑම් 44,100 ක්)	(රු.)	16,537,500
සෘජු ශ්‍රම පිරිවැය (පැයකට රු.260/- බැගින්, පැය 33,500 ක්)	(රු.)	8,710,000
විචල්‍ය පොදුකාර්ය	(රු.)	4,422,000

(a) පහත සඳහන් විචලනයන් **ගණනය කරන්න**.

(i) සෘජු ද්‍රව්‍ය මිශ්‍රණ විචලනය.

(ii) සෘජු ද්‍රව්‍ය ඵලදා (Yield) විචලනය.

(iii) විකුණුම් පරිමා ආන්තික විචලනය.

Example 04:

සීමාසහිත පොප් සමාගම, ද්‍රව්‍ය දෙකක් භාවිත කරමින් **X** නම් වූ නිෂ්පාදිතය නිෂ්පාදනය කරයි. පහත සඳහන් තොරතුරු ප්‍රමිත පිරිවැය පත්‍රිකාවෙන් උපුටාගෙන ඇත:

විස්තරය	**ඒකකයකට රු.**
A සෘජු ද්‍රව්‍යය - කිලෝග්‍රෑම් 1 ක් රු.400/- බැගින් කිලෝග්‍රෑම් 2 ක්	800
B සෘජු ද්‍රව්‍යය - කිලෝග්‍රෑම් 1 ක් රු.150/- බැගින් කිලෝග්‍රෑම් 3 ක්	450

2017 ජූනි මාසය තුළ, **සීමාසහිත පොප් සමාගම, A** සෘජු ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 22,000 ක් සහ **B** සෘජු ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 28,000 ක් භාවිත කරමින් **X** නිෂ්පාදිත ඒකක 10,000 ක් නිෂ්පාදනය කර විකුණන ලදි.

ඔබ විසින් කළ යුතු දෑ:

සෘජු ද්‍රව්‍ය මිශ්‍රණ විචලනය (Direct Material Mix Variance) **ගණනය කරන්න.** (ලකුණු 05)

JMC vLearning "your virtual learning partner"

මෙහෙයුම් ප්‍රකාශන

අයවැය ගත ලාභය සහ සත්‍ය ලාභය විචලතා සංයෝජනය මගින් කෙසේ සංසන්දනය කරන්නේ දැයි පෙන්වන ප්‍රකාශ මෙහෙයුම් ප්‍රකාශනයයි.

ප්‍රමිත අන්තර්ග්‍රහණ පිරිවැයකරණය යටතේ මෙහෙයුම් ප්‍රකාශනයක ආකෘතියක් පහත දැක්වේ.

	රු.	රු.
අයවැය ගත ලාභය		x
විකුණුම් පරිමා ලාභ විචලතාවය		x
සත්‍ය විකුණුම් වලින් ප්‍රමිත ලාභය		x

	(F)	(A)	
විචලතාවයන්	රු.	රු.	
විකුණුම් මිල			
ද්‍රව්‍ය මිල			
ද්‍රව්‍ය භාවිතය			
ශ්‍රම අනුපාත			
ශ්‍රම කාර්යක්ෂමතා			
විචල්‍ය පොදුකාර්ය වියදම්			
විචල්‍ය පොදුකාර්ය කාර්යක්ෂමතා			
ස්ථාවර පොදුකාර්ය වියදම්			
ස්ථාවර පොදුකාර්ය පරිමා			
සත්‍ය ලාභය	x	x	x
			x

JMC vLearning "your virtual learning partner"

Example 05:

සීමාසහිත PX සමාගම, Q නමැති නිෂ්පාදිතය, නිෂ්පාදනය කර විකුණයි. පහත සඳහන් තොරතුරු **සීමාසහිත PX සමාගමේ** 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොත්වලින් උපුටා ගන්නා ලදි. ඒකකයක ප්‍රමිත පිරිවැය සහ ප්‍රමිත විකුණුම් මිල පහත සඳහන් පරිදි විය:

	රු. (ඒකකයකට)	
විකුණුම් මිල		810
විචල්‍ය පිරිවැය:		
සෘජු ද්‍රව්‍ය (කිලෝග්‍රෑම් 1 ක් රු.80/- බැගින් කිලෝග්‍රෑම් 5)	400	
සෘජු ශ්‍රමය (පැයකට රු.250/- බැගින් පැය 0.6)	150	
විචල්‍ය පොදුකාර්ය (පැයකට රු.140/- බැගින් පැය 0.6)	84	634
ඒකකයක දායකය		**176**

වර්ෂය සඳහා අදාළ වන සත්‍ය තොරතුරු:

	රු.
විකුණුම් ආදායම (ඒකක 80,070)	64,536,420
සෘජු ද්‍රව්‍ය (කිලෝග්‍රෑම් 398,500)	32,677,000
සෘජු ශ්‍රමය (පැය 48,900)	10,758,000
විචල්‍ය පොදුකාර්ය	7,237,200

- වර්ෂය සඳහා සත්‍ය නිෂ්පාදනය ඒකක 80,070 කි.
- සෘජු ශ්‍රම පැය ගණන මත පදනම්ව විචල්‍ය පොදුකාර්ය අයකරනු ලැබේ.
- 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත නිෂ්පාදන සහ විකුණුම් ප්‍රමාණය ඒකක 80,000 කි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(i) විකුණුම් මිල විචලනය (Sales Price Variance).

(ii) විචල්‍ය පොදුකාර්ය වියදම් විචලනය (Variable Overhead Expenditure Variance).

(iii) විචල්‍ය පොදුකාර්ය කාර්යක්ෂමතා විචලනය (Variable Overhead Efficiency Variance). (ලකුණු 06)

(b) පහත සඳහන් අතිරේක තොරතුරු භාවිත කරමින්, අයවැයගත දායකය, සත්‍ය දායකය සමග සැසඳීමට මෙහෙයුම් ප්‍රකාශනයක් **පිළියෙල කරන්න**:

අයිතමය	**රු.**	**විචලනය**
සෘජු ද්‍රව්‍ය මිල විචලනය	797,000	අවාසි
සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය	148,000	වාසි
සෘජු ශ්‍රම අනුපාත විචලනය	1,467,000	වාසි
සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලනය	214,500	අවාසි
විකුණුම් පරිමා ආන්තික විචලනය	12,320	වාසි

(ලකුණු 04)
(මුළු ලකුණු 10)

JMC vLearning
"your virtual learning partner"